# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 28 දරන

# සුබිත ගෘහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 28 දරන සුබිත ශුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 27 වන දින.]

එල්. ඩී.—ඕ. 60/82.

## සුබිත ශුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සුබිත ශුභසාධක සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ ගල්පාත පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබූවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1984 අංක 28 දරන සුබිත ශුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සුබිත ශුභසාධක සංගමය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුබිත ශුභසාධක සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සුබිත ශුභසාධක සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මානසික, ශාරීරික හා සමාජ ඌනතාවන්ගෙන් පෙළෙන ළමයින් සහ වැඩිහිටියන් සඳහා ශුභසාධක ආයතන පිහිටුවා පවත්වා ගෙන යාමෙන් ඔවුන්ට ආරක්ෂාව සැලසීම, රැක බලා ගැනීම, ප්‍රතිකාර කිරීම, අධ්‍යාපනය ලබා දීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම යන මේවා නංවාලීම ;

(ආ) අනාථයන්ට ආධාර දීම සහ ඔවුන්ගේ ශුභසාධනය සැලසීම ; සහ

(ඇ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සේවක පිරිස් නියුක්ත කර ගැනීමේ, සේව යෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ආකාර යක සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත වූ විධායක කමිටුවක් විසින්, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී ධුර දරන සංස්ථාවේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

භාරකාර මණ්ඩලය.

6. (1) සංස්ථාවේ සියලු නිශ්චල දේපළවල භාරකාරත්වය, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් වෙත, සංස්ථාවේ රීතිවලට යටත්ව, පවරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී නිල දරන සංගමයේ භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද නිලධරයන් තෝරා පත් කර ගැනීම, විධායක කමිටුව සහ භාරකාර මණ්ඩලය තෝරා පත් කර ගැනීම සඳහා ද සංස්ථාවේ නිලධරයන්ගේ, විධායක කමිටුවේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහා ද සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධ යෙන් ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීමේ බලය සංස්ථාවට ඇත්තේ ය. එසේ සාදන ලද රීති, එවැනි ම මහා සභා රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

**8.** මෙම පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා වූ සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය.

*සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.*

**9.** මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියෝදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**10.** සංස්ථාවේ විධායක කමිටුවේ සාමාජිකයන් තුන්දෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටිය බවට සළකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.*

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.